බස්නාහිර පළාතේ, සමුපකාර සේවක කොමිෂන් සභා,
චක්‍ර ලේඛ අංක:08/94.

මගේ අංකය:බප/සසේකො/ච,
සමුපකා ර සේවක කො මිෂන් සභාව(බ.ප.),
මහ ලේකම් කාර්යාලය, III වන මහල,
මාලිගාවත්ත - කොළඹ - 10.
1994 ජූලි මස 11 දින.

බස්නාහිර පළාතේ, සියළුම සමුපකාර සමිතිවල,
සභාපති වරුන් වෙත.

1971 උපාධිධාරී අභ්‍යාස යෝජනා ක්‍රමය යටතේ,
සමුපකාර සමිතිවල තනතුරු සඳහා අනුයුක්ත ව වූ,
උපාධිධාරීන්ට පරිබාහිරව සමුපකාර සමිතිවල සේවය
කරන උපාධිධාරී නිලධාරීන්.

---

1971 උපාධිධාරී අභ්‍යාසලාභීන් වශයෙන් බඳවාගෙන සමුපකාර සමිතිවලට අනුයුක්ත වී සේවය කරනු ලබන උපාධිධාරීන් ගේ වැටුප් පරිමාණයන් පිළිබඳව කො මිෂන් සභාව විසින් අංක:180/90 හා 1990.06.27 දින දරණ චක්‍රලේඛය මගින් සියළුම සමුපකා ර සමිතිවලට උපදෙස් දී ඇත. එහෙත්, උපාධිධාරී අභ්‍යාසලාභී යෝජනා ක්‍රමයෙන් පරිබාහිරව සමිතිවල සේවය කරනු ලබන උපාධිධාරීන් පිළිබඳව එහි කිසිවක් සඳහන් නොවන නිසා, එම උපාධිධාරීන් ට ද යථෝක්ත චක්‍රලේඛයේ 03 වන ඡේදය හැර එහි අනිකුත් විධිවිධාන 1994.05.01 දින සිට, එලෙසින් ම බලපාන බවට කොමිෂන් සභාව තීරණය කරන ලදී.

02. තවද, කළමණාකරණ මට්ටමේ තනතුරක වසර තුනක සේවා කාලයක් සපුරා ඇති සමුපකාර සමිතිවල සේවය කරන සියළුම උපාධිධාරීන්ට ස්වකීය වැටුපට අමතරව රු:750/= ක මාසික දීමනාවක් 1994 මැයි මස සිට ක්‍රියාත්මක වන පරිදි ගෙවිය යුතු බවට ද තීරණය කර ඇත.

03. බස්නාහිර පළාතේ, සමුපකාර සංවර්ධන කොමසාරිස්තුමා ගේ ද එකඟත්වය ඇතිව මෙම චක්‍ර ලේඛය නිකුත් කරනු ලැබේ.

(අත්සන)
වී.ඒ.සුමනතිස්ස,
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

පිටපත්:-
01. බස්නාහිර පළාතේ, ආහාර, කෘෂිකර්ම හා සමුපකාර අමාත්‍යාංශයේ ලේකම්,
02. ස.සං.කො./රෙ.(බ.ප.).
03. ආහාර, සමුපකාර හා ජනසවිය ලේකම්.
04. ස.සං.කො./රෙ.
05. ලේකම්, සමුපකාර සේවක කොමිෂන් සභාව.
06. ප්‍රාදේශීය ලේකම්............................

...ම/-